# විභාග පරීක්ෂක වාර්තාව

## අවසාන විභාගය -- ජූලි 2014

## (61) විගණනය

සමස්ථයක් ලෙස මෙම ප්‍රශ්න පත්‍රයට අපේක්ෂකයන් විසින් තරමක් සතුටුදායක අන්දමට පිළිතුරු සපයා ඇත. මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳව විභාග පරීක්ෂකයන්ගේ නිරීක්ෂණ ඇතුළත් සවිස්තර වාර්තාව පහත දැක්වේ.

**ප්‍රශ්න 01 (ලකුණු 19)**

මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂකයන්ගේ න්‍යායාත්මක දැනුම පරීක්ෂාවට ලක්කර ඇති මෙම කොටස සඳහා ආසන්න වශයෙන් සියළුම අපේක්ෂකයන් පිළිතුරු සැපයීමට උත්සාහ කර තිබුණි. අපේක්ෂකයන් අතරින් මුළු ලකුණු ප්‍රමාණයට ලබා ගැනීමට සමත් වූයේ අතලොස්සක් වූ සංඛ්‍යාවකි. අපේක්ෂකයන් වැඩි සංඛ්‍යාවක් වෙන් කළ ලකුණු වලින් 50% ප්‍රමාණයක් ලබා ගැනීමට සමත් විය.

(a) ප්‍රශ්නයේ මෙම කොටසින් විගනනය හා විමර්ශනය අතර වෙනස පිළිබඳව අපේක්ෂකයන් සතු දැනුම පරීක්ෂාවට ලක් කර ඇත. සියලුම අපේක්ෂකයන් මෙම කොටස සඳහා ඉතා සාර්ථකව පිළිතුරු සපයා මුළු ලකුණු සංඛ්‍යාවට ලබා ගැනීමට සමත් විය.

කෙසේ වෙතත් සමහර අපේක්ෂකයන් විසින් විගණනයක වැදගත්කම අංගයක් වූ මතයක් ප්‍රකාශ කිරීම පිළිබඳව සඳහන් කිරීමට අමතක කර තිබිණි.

**පිළිතුරු සැපයීම සතුටුදායකයි**

(b) මෙම කොටසින් බලාපොරොත්තු වූයේ නිශ්චිත ව්‍යාපර ව්‍යවසායන් ගණනයට අයත්වන ආයතන හතරක් සඳහන් කරන ලෙසයි. මෙය නිශ්චිතව පිළිතුරු සැපයීය යුතු අපේක්ෂකයන් හට මුළු ලකුණු සංඛ්‍යාවට ලබාගත හැකි පහසු ප්‍රශ්නයකි. නමුත් අපේක්ෂකයන් සුළු සංඛ්‍යාවක් පමණක් මෙම කොටසට නිවැරදිව පිළිතුරු සපයා මුළු ලකුණු ප්‍රමාණයම ලබා ගැනීමට සමත් වී තිබිණි. තවද සැලකිය යුතු අපේක්ෂකයන් සංඛ්‍යාවක් නිවැරදි පිළිතුරු සැපයීමට අපොහොසත් වූ අතර ඔවුන්ට නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් (SBE) යනු කවර ආයතනද යන්න පිළිබඳව නිශ්චිත අදහසක් නොතිබීම ඊට හේතුව විය.

නිදෘ:- බහුතරයක් අපේක්ෂකයන් රාජ්‍ය ආයතන නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් ලෙස නම්කර තිබුණි. එම වැරදි පිළිතුරු වලින් සමහරක් පහත දක්වා ඇත.

- රාජ්‍ය දෙපාර්තමේන්තු
- රාජ්‍ය සංස්ථා
- ව්‍යවස්ථාපිත මණ්ඩල

සමහර අයදුම්කරුවන් පහත සඳහන් ආයතනවල නම් නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් ලෙස නම්කර තිබුණි.

- විදුලිබල මණ්ඩලය
- ශ්‍රී ලංකා විනිමය කොමිසම් සභාව
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය
- ශ්‍රී ලංකා විගණන හා ගණකාධිකරණ ප්‍රමිත මණ්ඩලය
- ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
- ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

තවත් සමහර අයදුම්කරුවන් පහත සඳහන් ආයතන නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් ලෙස නම් කර තිබුණි.

- මහජන බැංකුව
- සම්පත් බැංකුව
- යුනිලිවර්
- මැලිබන්

**පිළිතුරු සැපයීම සතුටුදායක නොවේ**

(c) මෙහිදී විභාග පරීක්‍ෂකතුමා විසින් බලාපොරොත්තු වූයේ අභ්‍යන්තර විගණකගේ කාර්යයන් කවරේද යන්න පිළිතුරු ලෙස සඳහන් කිරීමයි. සමස්ථයක් ලෙස අයදුම්කරුවන් මෙම කොටස ආශ්‍රිතව තමන්ගේ දැනුම විදහා දක්වමින් වැඩිලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට සමත් වූ අතර ඉතා සුළු ප්‍රමාණයක අයදුම්කරුවන් සංඛ්‍යාවක් ප්‍රශ්නයට කිසිසේත් අදාළ නොවන පිළිතුරු සපයා තිබීම නිසා කිසිදු ලකුණක් ලබා ගැනීමට අසමත් විය.

සපයා තිබූ එම පිළිතුරුවලින් සමහරක් පහත දැක්වේ.

- මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඒ මත මතයක් ප්‍රකාශ කිරීම.
- කළමනාකරණයට අවශ්‍ය පරිදි අභ්‍යන්තර විගණනය සිදු කිරීම.
- බාහිර විගණනකට අවශ්‍ය තොරතුරු ලබාදීම.
- සමහර අයදුම්කරුවන් විගණනයේ ප්‍රාථමික හා ද්විතීයික අරමුණු අභ්‍යන්තර විගණකගේ කාර්යයන් ලෙස සඳහන් කර තිබීම.
- තවත් සමහර අයදුම්කරුවන් විගණනයේ ආවේණික සීමා අභ්‍යන්තර විගණකගේ කාර්යයන් ලෙස සඳහන් කර තිබිණි.

**පිළිතුරු සැපයීම:- තරමක් දුරට සතුටුදායකයි**

(d) පරීක්‍ෂකතුමා විසින් මෙම කොටසින් බලාපොරොත්තු වූයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට අදාළ පොදු මූලධර්ම දෙකක් කෙටියෙන් පැහැදිලි කිරීමයි. බහුතරයක් අයදුම්කරුවන් හට මෙම කොටස සඳහා සාර්ථකව නිවැරදි පිළිතුරු සැපයීමට නොහැකි වී තිබිණි.

බහුතරයක් අයදුම්කරුවන් විගණන ආචාරධර්මයක් පැහැදිලි කිරීම පිළිතුරු ලෙස සඳහන් කිරීම නිසා ලකුණු ලබා ගැනීමට නොහැකි විය.

**පිළිතුරු සැපයීම:- දුර්වලයි**

(e) ප්‍රශ්නයේ මෙම කොටසින් විභාග පරීක්‍ෂකතුමා විසින් අපේක්‍ෂා කරන ලද්දේ ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ සාමජිකයන්ට අදාළ වන වෘත්තීය චර්යාව හා ආචාර ධර්ම සංග්‍රහයට අනුව සාමාජිකයකුගේ භාරකාරත්වයට පවරන ලද සේවාදායකයෙකුගේ මුදල් සම්බන්ධයෙන් ඔහුගේ වගකීම කෙටියෙන් පැහැදිලි කිරීමයි.

බහුතරයක් අයදුම්කරුවන් මෙම කොටස සඳහා බලාපොරෙත්තු වූ පරිදි නිවැරදි පිළිතුරු ලබාදීමට අපොහොසත් විය. ඉන් පෙනී යන්නේ වෘත්තීය ආචාර ධර්ම පද්ධතිය පිළිබඳව අයදුම්කරුවන් සතුව නිසි අවබෝධයක් නැතිකමයි.

**පිළිතුරු සැපයීම :- සතුටුදායක නොවේ.**

**ප්‍රශ්න අංක 02 (ලකුණු 11)**

සමස්ථයක් ලෙස ගත් කළ මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම සතුටුදායක නොවේ. මෙම කොටසින් සමස්ථ විගණන උපාය මාර්ගයන්, ප්‍රමාණාත්මක බව හා විගණක අවධානම යන කරුණු සම්බන්ධව අයදුම්කරුවන් සතු දැනුම පරීක්ෂාවට ලක්කර ඇත. ප්‍රමාණවත් ලකුණු සංඛ්‍යාවක් ලබා ගත හැකි පරිදි පිළිතුරු සැපයීමට බහුතරයක් අයදුම්කරුවන්ට නොහැකි විය.

(a) මෙම කොටසින් සමස්ථ විගණන උපාය මාර්ගය යන්නෙහි අදහස පැහැදිලි කිරීම අපේක්ෂා කරන ලදි.

බහුතරයක් අයදුම්කරුවන් මේ කොටස සඳහා නිවැරදිව පිළිතුරු සපයන වෙන් කළ මුළු ලකුණු ප්‍රමාණයම ලබා ගැනීමට අසමත් විය. ඔවුන් විසින් සමූහ සමාගමක විගණනය සැළසුම් කිරීම, සේවාදායකයා සතු විවිධ වූ ව්‍යාපාර ආයතන ආදී කිසිසේත්ම අදාළ නොවූ පිළිතුරු සපයා තිබිණි.

**පිළිතුරු සැපයීම සතුටුදායක නොවේ.**

(b) මෙම කොටසින් බලාපොරොත්තු වූයේ ප්‍රමාණාත්මකතාව හා විගණන අවධානම අතර ඇති සම්බන්ධය පැහැදිලි කිරීමයි. බහුතරයක් අයදුම්කරුවන් ප්‍රමාණාත්මකය හා විගණන අවධානම යන දෙකෙහි වචනාර්ථය වෙන වෙනම පැහැදිලි කර තිබුණත් ඒ දෙක අතර ඇති ප්‍රතිලෝම සම්බන්ධතාවය පැහැදිලි කිරීමට අපොහොසත් විය.

තවද තවත් සමහර අයදුම්කරුවන් මෙම දෙක අතර අනුලෝම සම්බන්ධතාවයක් පවතින බව සඳහන් කර තිබීම නිසා ලකුණු ලබා ගැනීමට නොහැකි විය.

**පිළිතුරු සැපයීම:- සතුටුදායක නොවේ.**

(c) ප්‍රශ්නයේ මෙම කොටසින් පරීක්ෂකතුමා විසින් බලාපොරොත්තු වූයේ න්‍යායාත්මක දැනුම දී ඇති ප්‍රායෝගික අවස්ථාවට භාවිතා කිරීමයි. මෙහිදී විගණකයෙකු ලෙස සේවාදායක ආයතනයට අළුතින් පත් වූ අවස්ථාවක සේවාදායක ආයතනය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම සඳහා කළ යුතු විගණන ක්‍රියාමාර්ග කවරේද යන්න සඳහන් කිරීමයි. බහුතරයක් අයදුම්කරුවන් පහත සඳහන් කරුණු සඳහන් කර තිබිණි.

- පසුගිය විගණක සමග සාකච්ඡා කිරීම
- පසුගිය විගණකගේ කාර්ය පත්‍රිකා පරිශීලනය කිරීම.

මෙම පිළිතුරුවලින් පෙනී යන්නේ අයදුම්කරුවන් විසින් අසනු ලබන ප්‍රශ්නය නිවැරදිව අවබෝධකරගෙන නැති බවයි. අයදුම්කරුවන් කිහිප දෙනෙක් නිවැරදිව පිළිතුරු සපයා ලකුණු ලබාගෙන තිබුණි.

**පිළිතුරු සැපයීම සතුටුදායක නොවේ.**

(d) විභාග පරීක්ෂකතුමා විසින් ප්‍රශ්නයේ මෙම කොටසින් ව්‍යාපාරයක සිදුවිය හැකි වංචා පිළිබඳව අවධානය යොමු කර ඇත. මෙහිදී කළමනාකරණ ලිපියකට ඇතුළත් කළ යුතු වංචාවන් ආශ්‍රිතව වූ කරුණු තුනක් සටහන් කරන ලෙස පරීක්ෂකතුමා විසින් අපේක්ෂාකරන ලදී.

බහුතරයක් අයදුම්කරුවන්ට මෙම කොටස සඳහා නිවැරදිව පිළිතුරු සැපයීමට නොහැකි විය. සමහර අයදුම්කරුවන් විසින් සඳහන්කර තිබුණේ වංචාවන් හඳුනා ගැනීම/ සොයා ගැනීම විගණක සතු කාර්යයක් බවයි.

**පිළිතුරු සැපයීම:- සතුටුදායක නොවේ.**

**ප්‍රශ්න අංක 03 (ලකුණු 16)**

මෙම ප්‍රශ්නය සඳහා බහුතරයක් අයදුම්කරුවන් ලබාගත හැකි වූයේ වෙන් කළ මුළු ලකුණු ප්‍රමාණයෙන් 50% ක් පමණි. දී ඇති ප්‍රායෝගික අවස්ථාවක අභ්‍යන්තර පාලන පද්ධතියේ පවතින දුර්වලතා හඳුනා ගැනීමට මෙම ප්‍රශ්නයේ අරමුණ විය.

(a) ප්‍රශ්නයේ මෙම කොටසින් බලාපොරොත්තු වූයේ විගණ සාක්ෂි ලබා ගැනීමට භාවිතා කරන ක්‍රම කවරේද යන්නයි.

බහුතරයක් අයදුම්කරුවන් මෙම කොටස සඳහා නිවැරදිව පිළිතුරු සපයා වෙන් කළ මුළු ලකුණු ප්‍රමාණයට ලබා ගැනීමට සමත් විය.

**පිළිතුරු සැපයීම :- සතුටුදායකයි**

(b) ආයතනයට බාහිර ස්වාධීන මූලාශ්‍රයන්ගෙන් ලබා ගන්නා විගණන සාක්ෂි දෙකක් සඳහා උදාහරණ සඳහන් කරන ලෙස මෙම කොටසින් දක්වා තිබිණි.

බහුතරයක් අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු සපයා වෙන් කළ මුළු ලකුණු ප්‍රමාණයට ලබා ගන්නට සමත් වූවත් ඉතා සුළු සංඛ්‍යාවක් උදාහරණ ලෙස "ණයගැති ප්‍රකාශනය" හා "බැංකු ප්‍රකාශනය" යනාදිය සඳහන් කර තිබුණි.

**පිළිතුරු සැපයීම :- සතුටුදායකයි**

(c) විගණන කාර්ය පත්‍රිකාවක ස්වභාවය හා අන්තර්ගතය තීරණය කිරීමේදී විගණකයකු විසින් සළකා බැලිය යුතු සාධක 4 ක් සඳහන් කිරීම මෙම කොටසින් අපේක්ෂා කරන ලද්දේය. බහුතරයක් අයදුම්කරුවන් මෙම කොටස සඳහා නිවැරදිව පිළිතුරු සැපයීමට අපොහොසත් වූ අතර පහත දැක්වෙන වැරදි පිළිතුරු සඳහන් කර තිබුණි.

- විගණක විසින් කරනු ලබන විගණන ක්‍රියාපටිපාටීන්
- සත්‍ය හා සාධාරණ මතයක් ප්‍රකාශ කිරීමට අවශ්‍යවන ප්‍රමාණාත්මක මට්ටම

**පිළිතුරු සැපයීම :- දුර්වලයි**

(d) දී ඇති ප්‍රායෝගික අවස්ථාවකට න්‍යායාත්මක දැනුම භාවිතාකර ආයතනය ඇති අභ්‍යන්තර පාලන පද්ධතියේ පවතින දුර්වලතා තුනක් හඳුනාගෙන එම දුර්වලතා මගහරවා ගැනීම සඳහා. කළ යුතු ක්‍රියාමාර්ග පැහැදිලි කිරීම ප්‍රශ්නයේ මෙම කොටසින් අපේක්ෂා කර ඇත.

බහුතරයක් අයදුම්කරුවන් මේ සඳහා නිවැරදිව පිළිතුරු සැපයීමට සමත් වී තිබිණි.

**පිළිතුරු සැපයීම:- සතුටුදායකයි**

**ප්‍රශ්න අංක 04 (ලකුණු 18)**

මෙම ප්‍රශ්නයෙන් පරිගණක තොරතුරු පද්ධතියක් පිළිබඳව අයදුම්කරු සතු දැනුම පරීක්ෂාවට ලක්කර ඇත. මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන් සතුටුදායක ලෙස පිළිතුරු සපයා නොතිබිණි.

(a) පරිගණක ආධාරකයක් විගණන පටිපාටි යොදාගනු ලබන විට විගණක විසින් සැලකිල්ලට ගතයුතු කරුණු 3 සඳහන් කිරීම මෙහිදී අපේක්ෂා කරන ලද්දේය.

බහුතරයක් අයදුම්කරුවන්ට මේ සඳහා නිවැරදි පිළිතුරු සැපයීමට නොහැකිවීම නිසා ලකුණු ලබා ගැනිමට නොහැකි විය.

**පිළිතුරු සැපයීම:- දුර්වලයි.**

(b) i) ප්‍රශ්නයේ මෙම කොටසින් අපේක්ෂා කරන ලද්දේ පරිගණක තොරතුරු පද්ධතියක් සම්බන්ධයෙන් පොදු පාලනයන් කවරේද යන්න පැහැදිලි කිරීමයි.

සමහර අයදුම්කරුවන් මේ සඳහා පිළිතුරු ලෙස

- පාලනයන් බෙදා වෙන් කිරීම
- භාවිත අත්පොත

ආදී වැරදි පිළිතුරු සපයා තිබීමෙන් ලකුණු ලබා ගත නොහැකි විය.

ii) ප්‍රශ්නයේ මෙම කොටසින් පොදු පාලනයන්ට උදාහරණ තුනක් සඳහන් කරන ලෙස ඉල්ලා තිබිණි.

ප්‍රශ්නය නිවැරදි ලෙස අවබෝධ කර ගැනීමට අසමත්වීම නිසා සමහර අයදුම්කරුවන්ට නිවැරදිව පිළිතුරු සැපයීමට නොහැකි විය.

සමහර අයදුම්කරුවන් පහත සඳහන් කරුණු පිළිතුරු ලෙස සඳහන් කර තිබිණි.

- යෙදවුම් පාලනයන්/ මෙහෙයුම් පාලනයන්/ නිමැවුම් පාලනයන්
- අභ්‍යන්තර පාලනයන්/ මෙහෙයුම් පාලනයන්
- පරිගණක යෙදවුම්/ නිමැවුම් පාලනයන්

**පිළිතුරු සැපයීම:- දුර්වලයි**

(c) අභ්‍යන්තර විගණකගේ වැඩවල ප්‍රමාණාත්මකභාවය ඇගයීමේදී බාහිර විගණක විසින් සළකා බැලිය යුතු කරුණු 3 ක් සඳහන් කිරීම මෙම කොටසින් අපේක්ෂා කරන ලද්දේය.

ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කර නොගැනීම නිසා අයදුම්කරුවන් බහුතරයක් මෙම කොටස සඳහා නිවැරදිව පිළිතුරු සපයා නොතිබිණි. වැරදි පිළිතුරු වලින් සමහරක් පහත දක්වා ඇත.

- විගණකගේ දැනුම, කුසලතාවය, පෙර අත්දැකීම් හා විශේෂීකරණය ආදිය සඳහන් කළ හැක. මේ නිසා වෙන් කළ මුළු ලකුණු ප්‍රමාණය ලබා ගැනීමට නොහැකි විය.

**පිළිතුරු සැපයීම:- තරමක් දුරට සතුටුදායකයි**

(d) ප්‍රශ්නයේ මෙම කොටසින් විභාග පරීක්ෂකතුමා විසින් අපේක්ෂා කරන ලද්දේ පෙර කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන වෙනත් විගණකයකු විසින් විගණනය කර ඇති විට විගණකයකු විසින් ඉටුකළ යුතු විගණන ක්‍රියාපටිපාටි තුනක් කෙටියෙන් පැහැදිලි කිරීමයි.

බහුතරයක් අයදුම්කරුවන් මේ සඳහා නිවැරදිව පිළිතුරු සැපයීමට අපොහොසත් වූ අතර වැරදි පිළිතුරු වලින් සමහරක් පහත දක්වා ඇත.

- කළමනාකරණය සමඟ/ සේවකයන් සමඟ සාකච්ඡා කිරීම
- ආයතනයේ ලිපිලේඛන පරිශීලනය කිරීම

**පිළිතුරු සැපයීම :- තරමක් දුරට සතුටුදාකයි**

(e) විශේෂඥයෙකුගේ වැඩ පරිශීලනය කර ගැනීමේ අවශ්‍යතාවය තීරණය කිරීමේ විගණකයකු විසින් සළකා බැලිය යුතු සාධක 2 ක් ලැයිස්තුගත කරන්න.

බහුතරයක් අයදුම්කරුවන් ප්‍රශ්නය නිවැරදිව අවබෝධකර නොගැනීම නිසා ඉතා දුර්වල සහ කිසිසේත්ම අදාළ නොවන පිළිතුරු සපයා තිබිණි. ඉතා සුළු සංඛ්‍යාවක් වූ අයදුම්කරුවන් මේ සඳහා නිවැරදිව පිළිතුරු සපයා වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගෙන තිබිණි.

**පිළිතුරු සැපයීම:- තරමක් සතුටුදායකයි**

**ප්‍රශ්න අංක 05 (ලකුණු 20)**

මෙම ප්‍රශ්නයෙන් තහවුරු කිරීමේ ක්‍රියාපටිපාටි, පාලන පරීක්ෂාවන් හා ස්ථාවර වත්කම සත්‍යාපනය කිරීමේදී ගිණුම්කරණ සැසඳුම් සඳහා විගණන සාක්ෂි ලබා ගැමේ විගණන ක්‍රියාපටිපාටීන් හා තොග ආයතනයේදී පැන නගින ගැටළු හඳුනා ගැනීම ආදී කරුණු සමබන්ධව අයදුම්කරුවන් සතු දැනුම පරීක්ෂාවට ලක් කර ඇත.

(a) ප්‍රශ්නයේ මෙම කොටසින් අපේක්ෂා කරන ලද්දේ තහවුරු කිරීමේ ක්‍රියාපටිපාටි මත පමණක් විශ්වාස තබනවාට වඩා විගණකයකු පාලන පරීක්ෂාවන් සිදු කරන්නේ කවර අවස්ථාවකදීද යන්න කෙටියෙන් පැහැදිලි කිරීමයි.

බහුතරයක් අයදුම්කරුවන් මේ සඳහා නිවැරදිව පිළිතුරු සපයන මුළු ලකුණු ප්‍රමාණයට ලබාගෙන තිබුණි.

**පිළිතුරු සැපයීම:- සතුටුදායකයි**

(b) මෙම ප්‍රශ්නයෙන් මෝටර් වාහන සත්‍යාපනය කිරීමේදී, දී ඇති එක් එක් සැසඳුම සඳහා විගණන සාක්ෂි ලබාගැනීමට කළ යුතු විගණන ක්‍රියාපටිපාටිය බැගින් සඳහන් කිරීම අවශ්‍ය විය. සමහර අයදුම්කරුවන්ට සැදහුම් පිළිබඳව අවබෝධයක් නොතිබීම නිවැරදිව පිළිතුරු සැපයීමට නොහැකි විය.

**පිළිතුරු සැපයීම:- තරමක් දුරට සතුටුදායකයි**

(c) i) ප්‍රශ්නයේ මෙම කොටසින් අපේක්ෂා කරන ලද්දේ වෙළෙඳ ලැබිය යුතු මුදල් වලට අදාල පාලන පරීක්ෂාවන් හතරක් ලැයිස්තුගත කිරීමයි. සමහර අයදුම්කරුවන් මේ සඳහා පිළිතුරු සැපයීමේදී පාලන පරීක්ෂාවන් සඳහන් කරනවා වෙනුවට තහවුරු කිරීමේ ක්‍රියාපටිපාටීන් සඳහන් කිරීම නිසා ලකුණු ලබා ගැනීමට නොහැකි විය. ඉතා අතලොස්සක් වූ අයදුම්කරුවන් සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා මුළු ලකුණු ප්‍රමාණයට ලබා ගන්නා ලදී.

ii) මෙම කොටසින් අපේක්ෂා කරන ලද්දේ ණයට විකුණුම් සම්බන්ධයෙන් තහවුරු කිරීමේ ක්‍රියාපටිපාටි හතරක් ලැයිස්තුගත කිරීමයි. එය සඳහන් කර අයදුම්කරුවන් ලකුණු ලබාගෙන තිබුණි.

**පිළිතුරු සැපයීම :- තරමක් දුරට සතුටුදායකයි**

(d) දී ඇති ප්‍රායෝගික අවස්ථාව සඳහා න්‍යායාත්මක දැනුම භාවිතා කරමින් වසර අවසානයේ තොග සත්‍යාපනය කිරීමේ පැන නඟින ගැටළු හා විශේෂ අවධානය යොමු කළ යුතු කරුණු තුනක් සඳහන් කර ඒ සඳහා හේතු දැක්වීම අපේක්ෂා කළේය.

බහුතරයක් අයදුම්කරුවන් මේ සඳහා නිවැරදිව පිළිතුරු සපයා වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබා ගැනීමට සමත් විය. තවද සමහර අයදුම්කරුවන් කල් ඉකුත් වූ චොක්ලට් තොගය අවසන් තොගයෙන් කපා හැරීම හා පරිගණක තොගය වෙළෙඳ තොගය ලෙස නොව ස්ථාවර වත්කම් යටතේ වර්ගකළ යුතු බව හඳුනාගෙන නොතිබිණි.

**පිළිතුරු සැපයීම:- සතුටුදායකයි**

**ප්‍රශ්න අංක 06 (ලකුණු 16)**

මෙයට අදාල පිළිතුරු ස්වඅධ්‍යාපන පාඩම් මාලාවේ අඩංගු න්‍යායාත්මක කරුණු තුලින් පිළිතුරු සැපයිය හැකිය.

(a) ප්‍රශ්නයේ මෙම කොටසින් යම් ආයතනයක් ඊට අදාළ වන නීති රෙගුලාසි රාමුවට අනුගත නොවූ අවස්ථාවක විගණක විසින් අනුගමනය කළ යුතු විගණන ක්‍රියාපටිපාටි දෙකක් සඳහන් කිරීම අපේක්ෂා කර ඇත.

බහුතරයක් අයදුම්කරුවන් මේ සඳහා නිවැරදිව පිළිතුරු සපයා තිබිණි. සමහර අයදුම්කරුවන් පහත සඳහන් අදාළ නොවන පිළිතුරු සඳහන් කර තිබිණි.

- වරලත් ගණකාධිකාරී අයාතනය, ගණකාධීකාරී ආයතනයට, දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට, ශ්‍රී ලංකා විගණකාධිපති දෙපාර්තමේන්තුවට ආදී ආයතන වෙත වාර්තා කිරීම.
- විගණනයෙන් ඉවත් වීම.

**පිළිතුරු සැපයීම - සතුටුදායකයි**

(b) දී ඇති අවස්ථාවට අනුකුල ඉදිරිපත් කළ හැකි වෙනස් කළ විගණන මත දෙකක සඳහන් කරන ලෙස මෙම කොටසින් අපේක්ෂා කර ඇත.

සමහර අයදුම්කරුවන් සියළු විගණන මත පිළිතුරු ලෙස සඳහන් කර තිබූ අතර තවත් සමහර අයදුම්කරුවන් අහිතකර මතය, විකරණය කළ විගණන මතය ලෙස නාම් සඳහන් කර තිබූ අතර එම මතයන් පැහැදිලි කර නොතිබීම නිසා වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට නොහැකි විය.

**පිළිතුරු සැපයීම:- තමරක් දුරට සතුටුදායකයි**

(e) සමාගම් පනතට අනුකුලව පළමුවරට විගණකයකු පත්කළ යුතු ආකාරය කෙටියෙන් පැහැදිලි කිරීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කරන ලදී.

බහුතරයක් අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයන වෙන් කළ මුළු ලකුණු සංඛ්‍යාවට ලබා ගැනීමට සමත් විය.

තවත් සමහර අයදුම්කරුවන් පහත සඳහන් වැරදි පිළිතුරු සපයා තිබිණි.

- විගණකාධිපති,
- ජනාධිපතිුමා
- වරලත් ගණකාධිකාරී ආයතනය
- ආයතනයේ කළමනාකරණය
- තවත් සමහර අයදුම්කරුවන් විගණකගේ සුදුසුකම් මේ සඳහා පිළිතුරු ලෙස සඳහන් කර තිබිණි.

**පිළිතුරු සැපයීම :- සතුටුදායකයි**

(d) මෙම කොටසින් අපෙක්ෂාකරණ ලද්දේ අස්තිත්ත්වයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය කෙරෙහි බලපෑමක් ඇතිකර මූල්‍ය සිදුවීම් හෝ තත්ත්වයන් හතරක් සඳහන් කරන ලෙසයි.

බහුතරයක් අයදුම්කරුවන් මේ සඳහා නිවැරදිව පිළිතුරු සපයන මුළු ලකුණු ප්‍රමාණයට ලබාගැනීමට සමත් වුවත් සමහර අයදුම්කරුවන් මූල්‍ය සිදුවීම් වෙනුවට මෙහෙයුම් තත්ත්වයන් සම්බන්ධ සිදුවීම් දක්වා තිබීම නිසා කිසිදු ලකුණක් ලබා ගැනීමට නොහැකි විය.

**පිළිතුරු සැපයීම:- සතුටුදාකයි**

- * * * -